දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපෑල
மின்-அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இரஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය
எனது இல.
My No.
PSC/APL/9/34/2024

ඔබේ අංකය
உமது இல.
Your No.
ED/04/60/01/වා.ස්.මා -2024

දිනය
திகதி
Date
2024.09. 11

ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම
ශ්‍රී ලංකා විදුහල්පති සේවය

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බැලීමෙන් පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදුන් තීරණ www.psc.gov.lk දරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ පළ කර ඇත.

02) ඒ අනුව **වහාම** එකී ස්ථාන මාරු ක්‍රියාත්මක කරන ලෙසත්, නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් මෙයින් දන්වමි. එසේම මීළඟ වර්ෂයේ සිට වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී ස්ථාන මාරු පටිපාටිය මගින් නියම කර ඇති කාල සටහනට අනුගතව සියලු කටයුතු කිරීමට තරයේ සැලකිලිමත් වන ලෙස ඔබ වෙත දැන්වීමටද රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන ලද බව කාරුණිකව දන්වමි.

03) එසේම මේ වන විට සියළුම රාජ්‍ය ආයතනවල වාර්ෂික ස්ථාන මාරු පටිපාටිවල දක්වා ඇති ස්ථානමාරු කාල සටහන් සංශෝධනය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කර ඇති අතර ඔබ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන වාර්ෂික ස්ථාන මාරුවීම් වලට අදාළ වාර්ෂික ස්ථානමාරු පටිපාටීන්හි ස්ථානමාරු කාලසටහන්ද යථෝක්ත තීරණයට අනුගත වන පරිදි සංශෝධනය කර ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙසද එම කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වමි.

05) එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දන්වා එවීමක් සිදු නොකෙරෙන අතර, අදාල තීරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන බව දන්වා සිටිමි. මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2 (ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

06) රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් නොසිට ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බවද කාරුණිකව දැනුම් දෙමි.

07) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය පරිදි අදාල සියලුම නිලධාරීන් වහාම නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන වර්තමාන සේවා ස්ථානවලින් මුදා හැරීමට කටයුතු කිරීම විදුහල්පතිනරුන්ගේ වගකීම වන අතර, එය නිවැරදිව සිදු වන්නේද යන්න පිළිබඳව පුළුල් අධ්‍යයනයක් හා පසු විපරමක් සිදු කරන ලෙසද ඔබ වෙත දන්වා සිටිමි.

08) වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257 (V) වගන්තිය අනුව, සිය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සලකා තනතුර අතහැරයාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු බවද කාරුණිකව දන්වා සිටිමි.

09) එසේම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති ස්ථාන මාරු සම්බන්ධව ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හෝ නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සලකා නොබලන බව දන්වන අතර එවැනි ඉල්ලීම් හා නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.



ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ අභියාචනා
2024 සම්බන්ධ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ

අනු අංකය	මූලකුරු සමග නම	වර්තමාන සේවා ස්ථානය	ස්ථාන මාරු ලද පාසල/ සේවා ස්ථානය	රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය
1	ජී.ඩබ්.ඒ. නිමාලි මහත්මිය	ගා/මීපාවල අමරසූරිය විද්‍යාලය	ගා/ගාමිණී ම.ම.වි.	2024.12.31 දින දක්වා ස්ථාන මාරුව අත්හිටුවීම.
2	ඩබ්. එල්. ඩී.එස්.ආර්.කේ. විජේතුංග මහතා	ක/කොල්වින් ආර් ද සිල්වා ජා.පා.	ක/මිරිස්වත්ත ජා.පා.	අභියාචනය නිෂ්ප්‍රභ කිරීම
3	එම්. එන්. හොහොමඩ් නෞෂාඩ් නාහීර් මහතා	කෑ/මාව/ බදුරියා ම.ම.වි.	ස්ථානමාරුවක් ලබා දී නොමැත	අභියාචනය නිෂ්ප්‍රභ කිරීම
4	ආර්. ඩබ්.කේ. ඩබ්. එම්.එල්.එන්. තිලකරත්න බණ්ඩා මහතා	බණ්ඩාරානායකමධ්‍ය මහා වි. වේයන්ගොඩ	කැළණිය ශ්‍රී ධර්මාලෝක වි	අභියාචනය නිෂ්ප්‍රභ කිරීම
5	ආර්.එම්. විජේසේන මහතා	බ/බදුල්ල ම.ම.වි.	බ/හාලිඇල ම.ම.වි.	අභියාචනය නිෂ්ප්‍රභ කිරීම
6	එල්. ඒ. ඩබ්. එස්. ගුණවර්ධන මහතා	කෑ/ මයුරපාද ම.ම.වි.	කෑ/ශාන්ත මරියා ම.වි.	අභියාචනය නිෂ්ප්‍රභ කිරීම
7	ඩබ්. ඩී.එම්. දීප්තිකා මහත්මිය	දප/ගා/ බොනවිස්ටා විද්‍යාලය	ගා/බටේමුල්ලජාතික පාසල	අභියාචනයට ඉඩ ලබා දෙමින් ස්ථාන මාරුව අවලංගු කර 2024.10.25 දින සිට රිපන් බාලිකා විදුහලේ ඇතිවන පුරප්පාඩුව සඳහා ස්ථාන මාරු කිරීම
8	යූ.ජී.පී.ආර්. ප්‍රේමනිලක මහත්මිය	මහ/ධර්මරාජ විද්‍යාලය	මහ/දෙනු/ කඩුගහන්නාව ජා.පා	අභියාචනයට ඉඩ ලබා දෙමින් ස්ථාන මාරුව අවලංගු කිරීම
9	ජී.බී.ඩබ්.ජී.ඒ. නවරත්න මහත්මිය	මහ/ කිංස්වුඩ්වි.	මහ/කටු/අංකුඹුර පරාක්‍රම ම.ම.වි.	අභියාචනය නිෂ්ප්‍රභ කිරීම
10	එච්.එම්.කරුණාරත්න බණ්ඩා මහතා	මහ/කඩුගන්නාව ජාතික පාසල	මහ/ධර්මරාජ විද්‍යාලය	අභියාචනයට ඉඩ ලබා දෙමින් ලබා දී ඇති ස්ථාන මාරුව අවලංගු කිරීම
11	එච්.කේ. එස්. ලාලනී මහත්මිය	ගා/ සිරිධම්ම විද්‍යාලය	ගා/ මීපාවල අමරසූරිය විද්‍යාලය	අභියාචනය නිෂ්ප්‍රභ කිරීම
12	ඒ.සී.ජේ.හැන්නදිගේ මහතා	මාර/ මාතර මධ්‍යමහා විද්‍යාලය	මාර/ සිද්ධාර්ත මහා විද්‍යාලය, වැලිගම	නිලධාරියාගේ අසනීප තත්ත්වය සලකා බලා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් 2024.07.16 සිට 2025.01.16 දින දක්වා මාර/ශාන්ත තෝමස් උසස් බාලිකා විද්‍යාලයට තාවකාලිකව අනුයුක්ත කර ඇත. මාතර දිස්ත්‍රික්කයේ ජාතික පාසල්හි පුරප්පාඩු නොමැති බැවින් සෞඛ්‍ය තත්ත්වය සලකා බලා ගමන් කිරීමට පහසු පාසලක් ලබා ගැනීමට දකුණු පලාත් රාජ්‍ය සේවය වෙත මුදා හැරීම

අනු අංකය	මූලකුරු සමග නම	වර්තමාන සේවා ස්ථානය	ස්ථාන මාරු ලද පාසල/ සේවා ස්ථානය	රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය
13	පී.ජී.එල්. රණතුංග මහතා	රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලය රුවන්වැල්ල	දැරණියගල සිරි සමන් විද්‍යාලය	අභියාචනය නිෂ්ප්‍රභ කිරීම
14	එච්.ටී.එම්.ආර්.ආර්. කුමාර මහතා	කෑ/මාව මොළගොඩ ප්‍රාථමික විද්‍යාලය	ස්ථාන මාරු ලැබී නොමැත	අභියාචනය නිෂ්ප්‍රභ කිරීම
15	ඩී.යූ.එන්. පෙරේරා මහතා	ඩී.එස්.සේනානායක වි. කොළඹ	කොා/තර්ස්ටන් විදුහල	අභියාචනය නිෂ්ප්‍රභ කිරීම
16	යූ.ඩී.ජේ.රත්නකුමාර මහතා	ඩී.එස්.සේනානායක වි. කොළඹ	මීලාගිරිය ශාන්ත පාවුළු බාලිකා විදුහල	අභියාචනයට ඉඩ ලබා දෙමින් ස්ථාන මාරුව අවලංගු කිරීම

09/11

09/11